සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA1 විභාගය - 2018 ජූලි

## (AA11) මූල්‍ය ගිණුම්කරණ මූලිකයන්

(Financial Accounting Basics)

2018-07-28
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 09
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ* ***නොහැකි*** *ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්ය ප්‍රශ්න පහළොව (15) කි.

(මුළු ලකුණු 40)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.8 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යාපාරය කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශවයක් වන්නේ:

(1) අයිතිකරුවන්.
(2) රජය.
(3) ණයහිමියන්.
(4) ඉහත සඳහන් සියල්ලම. (ලකුණු 02)

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, සැපයුම්කරුවන්ගෙන් ලැබුණු භාණ්ඩ වාර්තා කිරීම සඳහා ගබඩා භාරකරු විසින් නිකුත් කරනු ලබන මූලාශ්‍ර ලියවිල්ල වන්නේ:

(1) ද්‍රව්‍ය අධියාචනා පත්‍රය [Material Requisition Note (MRN)] යි.
(2) ගැනුම් ඇණවුම [Purchase Order (PO)] යි.
(3) භාණ්ඩ ලැබීමේ පත්‍රිකාව [Goods Received Note (GRN)] යි.
(4) ජර්නල් වවුචරයයි. (ලකුණු 02)

1.3 කේවලස්වාමි ව්‍යාපාරයක අයිතිකරුවකු වන **පෙරේරා,** ඔහුගේ පෞද්ගලික වියදම් සඳහා රු.5,000/- ක මුදලක් ඔහුගේ ව්‍යාපාරයෙන් ලබාගෙන ඇති අතර, එය ව්‍යාපාරයේ ගැනිලි වශයෙන් සලකා ඇත. මෙසේ සැලකීමට අදාලවන ගිණුම්කරණ සංකල්පය වන්නේ:

(1) අස්තිත්ව (entity) සංකල්පයයි. (2) උපචිත (accrual) සංකල්පයයි.

(3) උපලබ්ධි (realization) සංකල්පයයි. (4) සංගතතා (consistency) සංකල්පයයි.

(ලකුණු 02)

1.4 2018 අප්‍රේල් 01 දින, **ධනපාල ෆර්නිචර්** වෙතින් රු.45,000/- ක් වටිනා කාර්යාල අල්මාරියක් කාර්යාලයේ භාවිතය සඳහා **සහන්** විසින් ණයට මිලට ගන්නා ලදී.

ඉහත ගනුදෙනුවෙන් ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම වන්නේ:

(1) වත්කම් වැඩිවීම සහ වගකීම් අඩුවීම. (2) හිමිකම අඩුවීම සහ වගකීම් අඩුවීම.

(3) වත්කම් වැඩිවීම සහ වගකීම් වැඩිවීම. (4) හිමිකම අඩුවීම සහ වගකීම් වැඩිවීම. (ලකුණු 02)

1.5 සම්ප්‍රදායක ගිණුම් වර්ගීකරණය යටතේ, මූර්ත (real) ගිණුම්, පෞද්ගලික ගිණුම් සහ නාමමාත්‍ර ගිණුම් වශයෙන් ලෙජර් ගිණුම්, වර්ගීකරණය කළ හැකිය.

පහත සඳහන් ඒවා අතුරෙන්, මූර්ත ගිණුමක් සඳහා උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) විකුණුම් ගිණුම. (2) වැටුප් සහ වේතන ගිණුම.

(3) ගොඩනැගිලි නඩත්තු ගිණුම. (4) යන්ත්‍රෝපකරණ ගිණුම. (ලකුණු 02)

1.6 පහත සඳහන් තොරතුරු **තෙලා මෝටර්ස් හි** 2018 මාර්තු 31 දිනට පැවති යන්ත්‍රෝපකරණවලට අදාල වේ:

| | |
|---|---|
| යන්ත්‍රෝපකරණවල පිරිවැය | රු.1,200,000/- |
| මිලදී ගත් දිනය | 2016 අප්‍රේල් 01 |
| ක්ෂය ක්‍රමය | හීනවන ශේෂ ක්‍රමය |
| වාර්ෂික ක්ෂය අනුපාතය | 20% |

ඉහත තොරතුරු මත පදනම්ව, 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා නිවැරදි ක්ෂය අයකිරීම වන්නේ:

(1) රු.240,000/-. (2) රු.192,000/-. (3) රු.153,000/-. (4) රු.768,000/-.

(ලකුණු 02)

1.7 පහත සඳහන් ඒවා අතුරෙන්, පරිගණකගත ගිණුම්කරණ පද්ධතියක් සඳහා යොමුවීමට හේතුවක් වන්නේ:

(1) ඉතා විශාල ආයෝජන පිරිවැයක් දැරීමට සිදුවීම.

(2) පද්ධතියේ වේගය ඉතා ඉහළ වීම.

(3) මානව වැරදි නිසා සමහර බිඳවැටීම් සිදුවීමට හැකියාවක් පැවතීම.

(4) තාක්ෂණය මත රැඳියාව ඉහළ වීම. (ලකුණු 02)

1.8 පහත සඳහන් ගනුදෙනු අතුරෙන්, හිමිකමේ වැඩිවීමක් සඳහා බලපාන ගනුදෙනුව කුමක් ද?

(1) රු.300,000/- ක කෙටිකාලීන ණයක් බැංකුවකින් ලබා ගැනීම.

(2) වෙළෙඳ ණයගැතියෙකුගෙන් රු.150,000/- ක් ලැබීම.

(3) ඉදිරි වර්ෂයේ ගොඩනැගිලි කුලිය සඳහා රු.560,000/- ක අත්තිකාරමක් ලැබීම.

(4) අයිතිකරු විසින් මුදලින් රු.150,000/- ක් ව්‍යාපාරයට යෙදවීම. (ලකුණු 02)

*අංක 1.9 සිට 1.15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි උත්තර, ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.9** "වගකීම" යන පදය නිර්වචනය කරන්න. (ලකුණු 02)

**1.10** මූල්‍ය ගිණුම්කරණයේ අරමුණු දෙකක්(02) සඳහන් කරන්න. (ලකුණු 02)

**1.11** 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **රෝස් ට්‍රේඩර්ස්හි** පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

| **විස්තරය** | **රු.** |
|---|---|
| 2017 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | 500,000 |
| 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභය | 175,000 |
| 2018 මාර්තු 31 දිනට වගකීම් | 425,000 |
| වර්ෂය තුළ ගැනිලි | 25,000 |

ඉහත සඳහන් තොරතුරු ඇසුරෙන්,

2018 මාර්තු 31 දිනට **රෝස් ට්‍රේඩර්ස්හි** මුළු වත්කම්වල වටිනාකම ගණනය කරන්න. (ලකුණු 03)

**1.12** පහත සඳහන් එක් එක් අවස්ථාව සඳහා අදාල වන ගිණුම්කරණ සංකල්පය සඳහන් කරන්න:

(a) විසුරුවා හැරීමේ තත්ත්වයට පත්වනතුරු අස්තිත්වය දිගුකාලයක් පවතින බව උපකල්පනය කරයි.

(b) ආදායම, මුදලින් ලැබුණේද නැද්ද යන්න නොසලකා අදාල ගිණුම්කරණ කාලපරිච්ඡේදයේදී හඳුනා ගනු ලබයි.

(c) අස්තිත්වය විසින් අනුගමනය කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්ති වර්ෂයයන් පුරා ඒකාකාරීව අනුගමනය කළ යුතුය. (ලකුණු 03)

**1.13** පහත සඳහන් එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍ය** යන්න සඳහන් කරන්න.

(a) වත්කම් + වගකීම් = ප්‍රාග්ධනය ලෙස ගිණුම්කරණ සමීකරණය දැක්විය හැකිය.

(b) ACCPAC යනු පොදු ගිණුම්කරණ මෘදුකාංග පැකේජයකට (general accounting software package) උදාහරණයකි.

(c) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ගිණුම්කරණයේ යෙදවුමකි.

(d) මූල්‍ය ගිණුම්කරණයේදී අතීත දත්ත විශ්ලේෂණය කරනු ලැබේ. (ලකුණු 04)

**1.14** **XYZ ට්‍රේඩර්ස්හි** පහත සඳහන් එක් එක් ගනුදෙනුව වාර්තා කිරීම සඳහා භාවිත කළ යුතු "මූලාශ්‍ර ලියවිල්ල" (Source Document) හඳුනා දක්වන්න:

(a) රු.15,000/- ක් වටිනා ලිපිද්‍රව්‍ය මුදලින් මිලට ගැනීම.

(b) ණයට ගත් රු.400,000/- ක තොග, තත්ත්වයෙන් අඩුවීම නිසා සැපයුම්කරුට හරවා යැවීම.

(c) රු.20,000/- ක් වටිනා අයිතම, **සීමාසහිත ABC සමාගමට** ණය පදනම මත විකිණීම.

(d) කාර්යාලයේ භාවිතය සඳහා, **සීමාසහිත PQRS සමාගමෙන්** රු.400,000/- ක ඡායාපිටපත් යන්ත්‍රයක් ණය පදනම මත මිලට ගැනීම. (ලකුණු 04)

**1.15** **ජනිත්,** කේවලස්වාමී ව්‍යාපාරයක් වන **ජනිත් ට්‍රේඩර්ස්හි** අයිතිකරු වේ. **ජනිත් ට්‍රේඩර්ස්හි** පහත සඳහන් එක් එක් ගනුදෙනුව සඳහා නිවැරදි ද්විත්ව සටහන සඳහන් කරන්න:

(a) කාර්යාල ප්‍රයෝජනය සඳහා මෝටර් රථයක් **සීමාසහිත AM (පෞද්ගලික) සමාගමෙන්** රු.1,000,000/- කට ණයට මිලට ගැනීම.

(b) වර්ෂය තුළදී අයිතිකරු විසින් ඔහුගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ලබාගත් භාණ්ඩවල පිරිවැය රු.12,000/- කි.

(c) වෙළෙඳ ණයගැතියෙකු වූ **මලික්** විසින් **ජනිත්ගෙන්** මිලට ගත් රු.40,000/- ක භාණ්ඩ හානිවී තිබීම නිසා ආපසු හරවා එවන ලදී. (ලකුණු 06)

(මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

ඇලුමිනියම් කබඩ් නිෂ්පාදකයෙකු වන **රෝයල් ට්‍රේඩර්ස්** හි 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ගිණුම් පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදී :

| | රු. |
|---|---:|
| අමුද්‍රව්‍ය මිලට ගැනුම් | 10,500,000 |
| ගෙනඒමේ කුලී - අමුද්‍රව්‍ය | 1,500,000 |
| සෘජු වේතන - නිෂ්පාදන සේවකයන් | 3,000,000 |
| වෙනත් සෘජු වියදම් | 5,000,000 |
| ගොඩනැගිල්ල මත රක්ෂණය | 500,000 |
| කම්හල් යන්ත්‍රෝපකරණ මත රක්ෂණය | 350,000 |
| ගොඩනැගිලි විදුලිය | 1,500,000 |
| කම්හල් කළමනාකරුගේ වැටුප | 1,100,000 |
| කම්හල් යන්ත්‍රෝපකරණ මත ක්ෂය | 300,000 |
| **2017 අප්‍රේල් 01 දිනට තොග:** | |
| අමු ද්‍රව්‍ය | 5,600,000 |
| නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කළ) | 2,200,000 |

පහත දැක්වෙන අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2018 මාර්තු 31 දිනට අවසාන තොග පහත පරිදි විය:

| | රු. |
|---|---:|
| අමුද්‍රව්‍ය | 4,900,000 |
| නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කළ) | 3,100,000 |

(2) ගොඩනැගිල්ල සම්බන්ධ වියදම් පහත පරිදි බෙදා වෙන්කළ යුතුය:

| | |
|---|---:|
| කර්මාන්ත ශාලාව | 80% |
| කාර්යාලය | 20% |

(3) නිෂ්පාදනය කරනු ලබන සෑම ඇලුමිනියම් අල්මාරියක් සඳහා රු.500/- බැගින් අතිරේක දීමනාවකට කම්හල් සේවකයන් හිමිකම් ලබන අතර, 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී අල්මාරි 1,000 ක් නිෂ්පාදනය කර තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **රෝයල් ට්‍රේඩර්ස්හි** නිෂ්පාදන ගිණුම **පිළියෙළ කරන්න**. (ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

**ශෙහාන්,** 2017 අප්‍රේල් 01 දින රු.2,200,000/- ක මුදලක් ආයෝජනය කරමින් **ශෙහාන් ට්‍රේඩර්ස්** නමින් තනි හිමිකාර ව්‍යාපාරයක් ඇරඹුවේය.

2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ලැබීම් ජර්නලයෙහි සහ මුදල් ගෙවීම් ජර්නලයෙහි (මුදල් පොත) සාරාංශය පහත දැක්වේ:

| | රු. |
|---|---|
| මුදල් ලැබීම් ජර්නලය (ලැබීම්): | |
| **ශෙහාන්** යෙදවූ ප්‍රාග්ධනය | 2,200,000 |
| වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබීම් | 2,300,000 |
| මුදල් ගෙවීම් ජර්නලය (ගෙවීම්): | |
| විදුලි බිල්පත් | 150,000 |
| වැටුප් | 450,000 |
| වෙළෙඳ ණයහිමියන්ට ගෙවීම් | 700,000 |
| 2017 ඔක්තෝම්බර් 01 දින අත්පත්කරගත් වාහනය | 2,000,000 |
| ගැනිලි | 400,000 |

පහත දැක්වෙන අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) සියලු විකුණුම් සහ ගැනුම් ණය පදනම මත සිදුකරනු ලබයි.

(2) වාහනය සඳහා සරල මාර්ග ක්‍රමය යටතේ පිරිවැය මත 10% බැගින් ක්ෂය ප්‍රතිපාදනය කිරීමට කළමනාකරණය තීරණය කර තිබේ.

(3) 2018 මාර්තු 31 දිනට පහත සඳහන් වියදම් උපචිත කළ යුතුවේ:

| | රු. |
|---|---|
| වැටුප් | 50,000 |
| විදුලිය | 15,000 |

(4) 2018 මාර්තු 31 දිනට **ශෙහාන් ට්‍රේඩර්ස්හි** ගිණුම් පොත්වල පහත සඳහන් ශේෂයන් ද පැවතුණි:

| | රු. |
|---|---|
| වෙළෙඳ ණයහිමියෝ | 800,000 |
| වෙළෙඳ ණයගැතියෝ | 900,000 |

(5) 2018 මාර්තු 31 දිනට තොග කිසිවක් නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018 මාර්තු 31 දිනට **ශෙහාන් ට්‍රේඩර්ස්හි** ශේෂ පිරික්සුම **පිළියෙල කරන්න**. (ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

**Q සහ Q සමාගමේ** ගිණුම් සහායක විසින් 2018 මාර්තු 31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම එකඟ නොවීය. වෙනස අවිනිශ්චිත ගිණුමකට හර කර කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදී. 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන අනුව රු.748,000/- ක ලාභයක් පෙන්නුම් කරන ලදී.

පහත දැක්වෙන වැරදි පසුව හඳුනා ගන්නා ලදී:

(1) වෙළෙඳ ණයහිමියෙකුගෙන් මිලට ගත් රු.600,000/- ක ගැනුම් සම්පූර්ණයෙන්ම ගිණුම් පොත්වලින් මඟහැරී තිබුණි.

(2) රු.25,000/- ක ලිපිද්‍රව්‍ය වියදම්, ලිපිද්‍රව්‍ය ගිණුමේ රු.52,000/- ක් ලෙස දක්වා තිබූ අතර, මුදල් පොතේ නිවැරදිව සටහන් කර තිබුණි.

(3) වෙළෙඳ ණයහිමියෙකු වන **සරත්ට** ගෙවූ රු.355,000/- ක් වැරදීමකින් වෙළෙඳ ණයහිමි ගිණුමේ රු.553,000/- ක් ලෙස සටහන් කර තිබුණි. කෙසේවෙතත්, එය මුදල් පොතේ නිවැරදිව සටහන් කර තිබුණි.

(4) රු.350,000/- කට ලැප්ටොප් පරිගණකයක් මිලට ගැනීම පරිගණක නඩත්තු ගිණුමේ සටහන් කර තිබේ. මෙය මුදල් පොතේ නිවැරදිව සටහන් කර තිබුණි.

(5) රු.50,000/- ක කුලී ආදායම, වැරදීමෙන් රු.5,000/- ක් ලෙස කුලී වියදම් ගිණුමට හරකර තිබූ අතර, එය මුදල් පොතේ නිවැරදිව සටහන් කර තිබුණි.

(6) රු.33,000/- ක ණයට විකිණීමක්, වෙළෙඳ ණයගැති ගිණුම සහ විකුණුම් ගිණුම යන ගිණුම් දෙකේම දෙවරක් සටහන් කර තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත වැරදි නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන් **පිළියෙල කරන්න.** (ලකුණු 06)

(b) **Q සහ Q සමාගමේ** 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගලපන ලද ලාභය / (අලාභය) **ගණනය කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

(A) කේවලස්වාමි ව්‍යාපාරයක් වන **මල්ටි ට්‍රේඩර්ස්හි** පොත්වලින් 2018 ජනවාරි මාසය සඳහා පහත සඳහන් ගනුදෙනු උපුටාගෙන ඇත:

| **දිනය** | **ගනුදෙනුව** |
|---|---|
| 2018.01.05 | පිරිවැය රු.150,000/- ක් වූ භාණ්ඩ තොගයක් රු.170,000/- කට ණය පදනම මත **රත්න ට්‍රේඩර්ස්** වෙත විකුණන ලදි. |
| 2018.01.20 | රු.100,000/- ක මුදලක් **රත්න ට්‍රේඩර්ස්** වෙතින් ලැබුණි. |
| 2018.01.22 | නැවත විකිණීම සඳහා රු.200,000/- ක් වටිනා භාණ්ඩ අත්පිට මුදලට මිලට ගන්නා ලදි. |
| 2018.01.27 | අයිතිකරු රු.1,000,000/- ක මුදලක් අමතර ප්‍රාග්ධනය ලෙස ව්‍යාපාරයට ආයෝජනය කරන ලදි. |
| 2018.01.31 | ජනවාරි මාසය සඳහා සේවක වැටුප් රු.125,000/- ක් ගෙවන ලදි. |

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත සඳහන් එක් එක් ගනුදෙනුව මගින් පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම **සටහන් කරන්න.**

(තොග + ණයගැතියෝ + මුදල් = හිමිකම් + වගකීම්) (ලකුණු 05)

(B) **රුවන් සහල්,** සහල් තොග වෙළෙන්දෙකි. පහත දැක්වෙන ගනුදෙනු **රුවන් සහල්හි** පොත්වලින් 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ මාසය සඳහා උපුටා ගන්නා ලදි:

| **දිනය** | **මූලාශ්‍ර ලියවිල්ල** | **විස්තරය** | **අයිතම විස්තර** | | |
|---|---|---|---|---|---|
| | | | **නම** | **ප්‍රමාණය (කිලෝග්‍රෑම්)** | **කිලෝ ග්‍රෑමයක මිල (රු.)** |
| 2018.03.01 | ඉන්වොයිස් අංක: 109 | **AB ට්‍රේඩර්ස්ගෙන්** ණයට ගැනුම් | සුදු සහල් | 1,500 | 70 |
| 2018.03.10 | ඉන්වොයිස් අංක: 231 | **ආනන්ද් ට්‍රේඩර්ස්ගෙන්** ණයට ගැනුම් | රතු සහල් | 2,000 | 60 |
| 2018.03.25 | ඉන්වොයිස් අංක: 352 | **රවී සහ පුත්‍රයෝ** වෙතින් ණයට ගැනුම් | බාස්මති | 1,200 | 90 |
| 2018.03.26 | හරපත් අංක: 35 | **ආනන්ද් ට්‍රේඩර්ස්** වෙත ආපසු යැවුම් | රතු සහල් | 200 | - |

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018 මාර්තු මාසය සඳහා **රුවන් සහල්හි** පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) ගැනුම් ජර්නලය (දෛනික ගැනුම් පොත).

(b) ආපසු යැවුම් ජර්නලය (දෛනික ගැනුම් ආපසු යැවුම් පොත). (ලකුණු 05)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්ය ප්‍රශ්න එක (01) කි.

(මුළු ලකුණු 20)

### 06 වන ප්‍රශ්නය

**ස්මාර්ට් ඩයල්** ජංගම දුරකතන සහ උපාංග විකිණීමේ නිරත කේවලස්වාමි ව්‍යාපාරයකි. 2018 මාර්තු 31 දිනට **ස්මාට් ඩයල්හි** ශේෂ පිරික්සුම පහත දැක්වේ:

**ස්මාර්ට් ඩයල්**

**2018 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| විස්තරය | හර | බැර |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ (පිරිවැයට): | | |
| ඉඩම | 4,000 | |
| ගොඩනැගිලි | 3,000 | |
| පරිගණක | 1,200 | |
| කාර්යාල උපකරණ | 800 | |
| 2017 අප්‍රේල් 01 දිනට, සමුච්චිත ක්ෂය: | | |
| ගොඩනැගිලි | | 1,000 |
| පරිගණක | | 480 |
| කාර්යාල උපකරණ | | 320 |
| විකුණුම් | | 10,900 |
| ගැනුම් | 8,500 | |
| 2017 අප්‍රේල් 01 දිනට, තොග | 1,500 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 2,200 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 3,800 |
| 2017 අප්‍රේල් 01 දිනට, අඩමාණ ණය සඳහා ප්‍රතිපාදනය | | 200 |
| ස්ථාවර තැන්පතුව (මාස 6) | 1,500 | |
| පොලී ආදායම | | 100 |
| බැංකු අයිරා පොලිය | 100 | |
| විදුලිය | 1,200 | |
| ගෙවූ සාප්පු ගොඩනැගිලි කුලිය | 600 | |
| අ'තැති මුදල් | 1,000 | |
| බැංකු අයිරාව | | 2,200 |
| සේවක වැටුප් | 1,800 | |
| විකුණුම් කොමිස් | 500 | |
| 2017 අප්‍රේල් 01 දිනට, ප්‍රාග්ධනය | | 8,900 |
| | **27,900** | **27,900** |

පහත දැක්වෙන අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2018 මාර්තු 31 දිනට අවසාන තොගය රු.3,500,000/- කට අගය කර තිබුණි.

(2) දේපළ, පිරියත සහ උපකරණ පහත සඳහන් අනුපාතයන්ට පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරීම ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වේ:

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | : | 5% |
| පරිගණක | : | 20% |
| කාර්යාල උපකරණ | : | 10 % |

(3) 2018 ජනවාරි 01 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය සඳහා රු.600,000/- ක් සාප්පු ගොඩනැගිලි කුලිය ගෙවා ඇත.

(4) රු.30,000/- ක වෙළෙඳ ලැබිය යුතු මුදලක් ලියා හැරීමටත් 2018 මාර්තු 31 දිනට පැවති ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂය මත 10% ක අඩමාණ ණය සඳහා පොදු ප්‍රතිපාදනයක් කිරීමටත් කළමනාකරණය විසින් තීරණය කරන ලදී.

(5) 2018 මාර්තු මාසය සඳහා ගෙවිය යුතු විකුණුම් කොමිස් රු.100,000/- කි.

(6) ස්ථාවර තැන්පතු පොලිය නිවැරදිව පොලී ආදායම් ගිණුමේ සටහන් කර තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 11)

(b) 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 09)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |